විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சு

Ministry of Power and Energy



2021

වාර්ෂික කාර්ය සාධන වාර්තාව (බලශක්ති අංශය)

வருடாந்த செயலாற்றுகை அறிக்கை (வலுசக்தி பிரிவு)

Annual Performance Report (Energy Section)

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය

වාර්ෂික කාර්ය සාධන වාර්තාව (බලශක්ති අංශය) - 2021

අංක 80, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.
දුරකථන අංකය - 011 2370032/33
වෙබ් අඩවිය - www.energymin.gov.lk

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව (බලශක්ති අංශය)
විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය
වැය ශීර්ෂ අංකය 115

අන්තර්ගතය

	පිටු අංකය
01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	**01**
1.1 හැඳින්වීම	01
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	03
1.3 සුවිශේෂී ප්‍රමුඛතා	04
1.4 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්	04
1.5 සංවිධාන සටහන	05
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන	06
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	06
02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**07**
2.1 හැඳින්වීම	07
2.2 ප්‍රගතිය	07
2.3 අනාගත අපේක්ෂා	22
2.4 මුහුණ දුන් ප්‍රධාන අභියෝග	23
03 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**25**
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	26
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	28
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	29
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්	31
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	48
3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය	48
3.7 මු.රෙ.208 ප්‍රකාරව, ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	49
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	49
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව	49
04 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**50**
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක	50
05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	**51**
06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	**52**
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	52
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය මඟින් වන බලපෑම	53
6.3 මානව සම්පත් සංවර්ධනය	53
07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	**54**

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

වර්ෂ 2020.08.09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍ය මණ්ඩල ව්‍යුහය, අමාත්‍ය මණ්ඩල, අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශවල අමාත්‍යවරුන්ගේ විෂය පථයන් හා කාර්යයන් ප්‍රකාශයට පත්කරනු ලැබූ අතර එම ගැසට් පත්‍රය මගින්, "බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම හා ඉන්ධන ආනයනය අඩු කර ගැනීම සඳහා ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි ඛනිජ තෙල් හා ගෑස් ඇතුළු අතුරු නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම, ගබඩා පහසුකම් පුළුල් කිරීම හා බෙදාහැරීම් කටයුතු හා අදාළ ප්‍රමිතීන්වල නියාමන කටයුතු හා අදාළ රාජ්‍ය ව්‍යාපාර කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීම" යන විෂය පථය ආවරණය වන පරිදි බලශක්ති අමාත්‍යාංශය පිහිටුවන ලදි.

ප්‍රතිපත්තිමය මග පෙන්වීම

ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව හා ස්වයංපෝෂිතභාවය ප්‍රධානතම ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික අරමුණක් වූ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මඟ පෙන්වීම හා රජය මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මෙම අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි. විදුලිබලය උත්පාදනය, ප්‍රවාහනය, කර්මාන්ත හා ගෘහස්ත පාරිභෝගික යන අංශ ඇතුළත් සමස්ත ජාතික බලශක්ති අවශ්‍යතාව අඩු වියදමකින් ලබා ගැනීම සහතික කිරීම උදෙසා බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය මෙන්ම අමාත්‍යාංශය යටතේ පවතින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හා ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, සහ නියාමනය කිරීම මේ අතර ප්‍රධාන වේ.

නීතිමය පැතිකඩ

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන පහත නීතිමය රාමුව යටතේ ක්‍රියාත්මක වේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

දිවයින තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, පිරිපහදු කිරීම, විකිණීම, සැපයීම සහ බෙදාහැරීමට අදාළ ව්‍යාපාරික කටයුතු කර ගෙන යාම සඳහා පිහිටුවන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තනි අයිතිය යටතේ එම කටයුතු හා ඊට අනුශාංගික කාර්යයන් පවත්වා ගැනීමට අදාළ නෛතික ප්‍රතිපාදන 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මඟින් ලබා දී තිබේ.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ ඛනිජ තෙල් හා නිෂ්පාදන ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම සහ බෙදාහැරීමේ තනි අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලබා දී තිබුණද, 2002 අංක 33 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත මඟින් එම කටයුතු කරගෙන යාම සඳහා සුදුසුකම් සහිත වෙනත් තරඟකරුවන්ටද ප්‍රවේශවීමට ප්‍රතිපාදන සැලසුණු අතර ඒ අනුව ලංකා ඉන්දියානු තෙල් සමාගම එම කටයුතු කරගෙන යාමේ තරඟකරුවෙකු බවට පත් විය.

ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පැවති ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු වෙන් කොට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඉන්දියානු තෙල් සමාගම යන ආයතන දෙකෙහි ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු වලට අදාළ පොදු පහසුකම් සපයන්නෙකු ලෙස, සමාගම් පනත යටතේ "ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම" ස්ථාපනය කරන ලදී.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන මෙහි කොටස් වලින් 2/3ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් වන අතර ඉතිරි 1/3 ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් වේ.

ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා ද, උද්ගාමී ඛනිජ තෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ නවීන භූ ගර්භ හා භූ භෞතික ගවේෂණය, සංවර්ධනය, නිෂ්පාදනය සහ කළමනාකරණ පරිචයන් තුළින් දේශීය ඛනිජ තෙල් සම්පත්වලට උපරිම ආර්ථික වටිනාකමක් ලබා ගැනීම සඳහා නියාමන හා කළමනාකරණ ව්‍යුහයක් සකස් කිරීම සඳහා ද, 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත 2021 ඔක්තෝම්බර් මස 08 වන දින සම්මත කරන ලදි. ඒ අනුව එතෙක් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ඉටු කරන ලද පෙර භාග ඛනිජ තෙල් කර්මාන්තයේ කටයුතු ඉටු කිරීම ඛනිජ තෙල් සම්පත් පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය වෙත පවරන ලදි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

දැක්ම

"ශ්‍රී ලංකාව ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීම"

මෙහෙවර

"ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම"

අරමුණු

- වසර 2050 දී කාබන් විමෝචනය ශූන්‍ය කළ රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා ප්‍රමුඛ දායකයකු බවට පත්වීම.
- 2023 වන විට පෙට්‍රල් සහ ඩීසල් සඳහා යුරෝ VI (EURO VI) ප්‍රමිතීන් හඳුන්වා දීම තුළින් ඒවායේ ගුණාත්මක තත්ත්වය උසස් කිරීම.
- වසර 2030 වන විට දේශීය ඛනිජ තෙල් සහ ස්වභාවික වායු නිෂ්පාදනය ප්‍රශස්ථ කිරීම මඟින් ශ්‍රී ලංකාවේ බලශක්ති ස්වයංපෝෂිතභාවයේ හවුල්කරුවකු වීම.
- ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- 2026 වන විට රටේ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම මෙරට පිරිපහදු මඟින් නිපදවීම.
- ආරක්ෂිත හා වඩාත් කාර්යක්ෂමව ඉන්ධන ගබඩා පහසුකම් තහවුරු කිරීම හා රට පුරා ඉන්ධන බෙදාහැරීම තහවුරු කිරීම.
- ඉන්ධන සැපයුම් දාමයෙහි ගුණාත්මක බව හා විශ්වසනීයත්වය තහවුරු කිරීම.
- කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතාව ප්‍රවර්ධනය කිරීම

1.3 සුවිශේෂී ප්‍රමුඛතා

- ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාවය සහ ස්වයංපෝෂිතභාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය හා උපාය මාර්ගික රාමුව සකස් කිරීම.
- ස්වාභාවික වායුව ගවේෂණය කිරීම කඩිනම් කිරීම.
- තෙල් පිරිපහදු ධාරිතාවය පුළුල් කරමින් නවීකරණය කිරීම.
- ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ගබඩා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයින් දිරිමත් කිරීම.
- කාර්මික අපද්‍රව්‍ය උපයෝගී කරගනිමින් කාර්යක්ෂම බලශක්ති උත්පාදනය දිරිමත් කිරීම.
- නව ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බලශක්ති භාවිතය උපරිම කිරීම.

1.4 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්

(i) නියමිත නීති සහ අනපනත්වලට අනුකූලව බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය.

(ii) බලශක්ති විෂය භාර අමාත්‍යවරයාගේ මග පෙන්වීම යටතේ බලශක්ති විෂය පථයට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමාත්‍ය මණ්ඩලයට සහ අණපනත් ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කිරීම සහ එයට අයත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

(iii) රජය විසින් පිළිගත් ජාතික ප්‍රතිපත්ති සහ නීතිරීතිවලට අනුව, අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ වාර්ෂික අයවැය තුළින් සැපයෙන ප්‍රතිපාදන තුළ ආංශික ප්‍රතිපත්ති හා සැලසුම් මෙහෙයවීම, මූල්‍ය ප්‍රතිපාදන උපරිම ඵලදායීතාවයකින් යුතුව යෙදවීම සහ අධීක්ෂණය.

(iv) ජාතික ප්‍රතිපත්ති තුළ අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ජනතා අවශ්‍යතා ඉලක්ක කර ගනිමින් කාලීනව යාවත්කාලීන කිරීම.

(v) අමාත්‍යාංශයේ විෂයපථය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රශස්ත කාර්යය මණ්ඩලය නිර්ණය කිරීම සහ විවිධ ආයතන අංශවලට අනුයුක්ත කර ඇති කාර්යය මණ්ඩලයට නිශ්චිත ලෙස වගකීම් පැවරීම.

(vi) අමාත්‍යාංශය යටතේ තිබෙන සංස්ථා හා වෙනත් ආයතන ස්වකීය දැක්ම හා මෙහෙවර ඉටුවන පරිදි කටයුතු කිරීම සඳහා මෙහෙයවීම හා අධීක්ෂණය.

(vii) අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති සියලුම ආයතනවල පරිපාලන කටයුතු, ගිණුම් පටිපාටි සහ ප්‍රසම්පාදන කටයුතු නියමිත ප්‍රමිතිවලට අනුව සිදු කිරීමට වගබලා ගැනීම සහ විගණන ක්‍රියාවලිය සඳහා සහය දැක්වීම.

(viii) බලශක්ති ක්ෂේත්‍රයට අදාළ රෙගුලාසි, අවසර පත්‍ර, බලපත්‍ර ජනහිතකාමී ලෙස සරල කරමින් ජනතා කේන්ද්‍රීය කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම හා නියාමනය.

1.5. සංවිධාන සටහන (බලශක්ති අංශය)



1.6 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන

■ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)
බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, 1961 අංක 28 දරන පාර්ලිමේන්තු පනත සහ එකී පනත සඳහා පසුව කරන ලද සංශෝධන ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, අපනයනය, පිරිපහදුව, අලෙවි කිරීම, සැපයීම හා බෙදාහැරීමට අදාළ ව්‍යාපාර සිදු කරනු ලබයි.

■ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද සමාගමකි. ඛනිජ තෙල් තොග ගබඩා පහසුකම්, ඉන්ධන ප්‍රවාහන නළ මාර්ග පද්ධති සහ ඉන්ධන ප්‍රවාහනය කිරීම සඳහා පොදු පහසුකම් සපයන්නා වශයෙන් ක්‍රියා කිරීම සඳහා වර්ෂ 2003 ඔක්තෝම්බර් මස 13 වැනි දින අංක 1310-8 දරන රජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව එය බලාත්මක කරන ලදි.

■ ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDA)
2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත යටතේ ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද අතර එතෙක් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ඉටු කරන ලද පෙර භාග ඛනිජ තෙල් කර්මාන්තයේ කටයුතු ඉටු කිරීම ඛනිජ තෙල් සම්පත් පනත යටතේ පිහිටුවන ලද ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කරනු ලැබේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)
අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද විදේශාධාර ව්‍යාපෘති නොතිබුණි.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත්කිරීමේ දැක්ම පෙරදැරි කර ගෙන, බලශක්ති අමාත්‍යාංශය විසින් 2021 වසර තුළ දී කාර්යයන් රැසක් ක්‍රියාවට නංවන ලදි. ඒ අනුව රටේ අඛණ්ඩ බලශක්ති ඉල්ලුම සපුරාලීම, බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම, කාර්යක්ෂමව ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම, ඉන්ධන සැපයුම් දාමයෙහි ගුණාත්මක බව හා විශ්වසනීයත්වය තහවුරු කිරීම සහ රටේ බලශක්ති අවශ්‍යතාවය දේශීයව සපුරා ගැනීම සඳහා බනිජ තෙල් ගවේෂණය කඩිනම් කිරීම යන ක්ෂේත්‍ර ඔස්සේ අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන විසින් 2021 වසර තුළ දී ඉටු කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති වල ප්‍රගතිය, ඉදිරි දැක්ම සහ අභියෝග මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කරනු ලබයි.

2.2 ප්‍රගතිය

2021 වර්ෂයේ ළඟාකර ගැනීම් ලුහුඩින්


නව ඉන්ධන පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කිරීම.


2021 අංක 21 දරන බනිජ තෙල් සම්පත් පනත සම්මත කිරීම.


ඝණ මීටර් 93000ක සමස්ථ ධාරිතාවයකින් යුත් ඉන්ධන ගබඩා ටැංකි 9ක ඉදිකිරීම් ආරම්භ කිරීම.


නව අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ බිම් කොටස් සිතියම ප්‍රසිද්ධ කිරීම.


ගුවන්ගත ගුරුත්වාකර්ෂණ හා චුම්භක ක්ෂේත්‍ර සමීක්ෂණය පැවැත්වීම.


ලිහිසි තෙල් සඳහා නව ප්‍රමිතීන් හඳුන්වා දීම.



ශ්‍රී ලංකා බනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීම


ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීමට පියවර ගැනීම



ඉන්ධන සැපයුම අඛණ්ඩව සපුරාලීම.

2.2.1 ඛනිජ තෙල් හා ස්වභාවික වායු ගවේෂණය

"ස්වාභාවික වායුව ගවේෂණය කිරීම කඩිනම් කිරීම" සුවිශේෂී ප්‍රමුඛතා අංශයක් ලෙස හඳුනා ගනිමින් අංක 2187/27 දරන 2020.08.09 දිනැති අමාත්‍යවරුන්ගේ සහ රාජ්‍ය අමාත්‍යවරුන්ගේ විෂයන් සහ කාර්යන් පවරා දීම සඳහා වන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මෙම වගකීම අප අමාත්‍යාංශය වෙත පවරන ලදි. ශ්‍රී ලංකාවේ කාවේරි, මන්නාරම් සහ ලංකා ද්‍රෝණි ආශ්‍රිතව ඛනිජ තෙල් හා ස්වභාවික වායු හමුවීමට සම්භාවිතාවක් පවතින බවට භූ ගර්භ හා භූ භෞතික ගවේෂණ මගින් සොයා ගෙන ඇති නමුත් ඛනිජ තෙල් ගවේෂණ හා සංවර්ධනය සඳහා පැවති විවිධ බාධක හේතුවෙන් එය යථාර්තයක් බවට පත්කර ගැනීමට මෙතෙක් අපොහොසත් වී ඇත. ඒ අනුව එම බාධක ඉවත් කර ඛනිජ තෙල් ගවේෂණයට අවශ්‍ය ආයෝජන ආකර්ශණය කර ගැනීම අරමුණු කර ගෙන නව ඛනිජ තෙල් සම්පත් පනත සම්පාදනය කිරීම, ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීම, නව අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණය බිම් කොටස් සිතියම ප්‍රකාශයට පත් කිරීම, ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම මෙන්ම ගුවන්ගත ගුරුත්වාකර්ෂණ හා චුම්භක ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කිරීම ඇතුළු පවත්නා අනෙකුත් ආයෝජන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට 2021 වසර තුළ දී පියවර ගන්නා ලදි.

(අ) නව ඛනිජ තෙල් සම්පත් පනත සම්පාදනය කිරීම

ශ්‍රී ලංකාවේ පෙරභාග ඛනිජ තෙල් කර්මාන්තයේ සංවර්ධන කටයුතු නියාමනය 2003 අංක 26 දරන ඛනිජ තෙල් සම්පත් පනත මගින් සිදු කරන ලද අතර මෙම පනතේ පැවැති ආයතනික සහ නීතිමය රාමුව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කර්මාන්තය කෙරෙහි ආයෝජකයන් ආකර්ෂණය කෙරෙහි රජයේ ස්ථාවරය අපැහැදිලි බවට හඳුනා ගන්නා ලදි. එම අඩු පාඩු මගහරවා ගනිමින් කර්මාන්ත සඳහා මනා ලෙස අර්ථ දක්වන ආයතනමය ව්‍යුහයක් හා නීති පද්ධතියක් ස්ථාපිත කිරීම අරමුණු කර ගෙන කෙටුම්පත් කළ 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත 2021.10.08 දින පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදි.

නව පනතින් හඳුන්වා දුන් විශේෂ ලක්ෂණ

- නිශ්චිත සහ ස්වාධීන නියාමන බලතල සහිතව ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය ස්ථාපනය කිරීම.
- අමාත්‍යවරයා සතුව පැවති නියාමන බලතල විමධ්‍යගත කරමින් නියාමන බලතලවලින් කොටසක් ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය වෙත පැවරීම.
- ශ්‍රී ලංකා රජයේ සහභාගිත්ව අයිතිය නියෝජනය කිරීම සඳහා ජාතික ඛනිජ තෙල් මෙහෙයුම් කරුවකු ස්ථාපිත කිරීම.
- උපායමාර්ගික සැලසුමකට අනුව ඛනිජ තෙල් සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සඳහා ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් ස්ථාපනය කිරීම.
- ඛනිජ තෙල් සම්පත සහ ඛනිජ තෙල් දත්ත සඳහා රාජ්‍ය හිමිකම තහවුරු කිරීමට ප්‍රතිපාදන සලසාදීම.
- ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, නිෂ්පාදනය සහ කළමනාකරණය සඳහා ප්‍රතිපාදන සලසා දීම.
- ස්වාධීන, කාර්යක්ෂම සහ විනිවිදභාවී උද්ගාමී කර්මාන්තය සඳහා ප්‍රතිපාදන ඇති කිරීම

(ආ) ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීම

නිශ්චිත බලතල සහිත ස්වාධීන නියාමකයෙකුගේ අවශ්‍යතාවය සපුරාලමින් ඛනිජ තෙල් සම්පත් පනතේ ප්‍රතිපාදන අනුව ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද අතර අධිකාරියේ අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීම පහසු





කරනු පිණිස, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම් ද අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදි. ඒ අනුව ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් ප්‍රවීනයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය මගින් කර්මාන්තයේ නියාමන කටයුතු සාර්ථකව සිදු කරමින් පවතී.

(ඇ) ජාතික තෙල් සහ වායු සමාගම ස්ථාපිත කිරීම.

ඛනිජ තෙල් සම්පත් පනතේ 25(1) වගන්තිය මඟින් ඛනිජ තෙල් සම්පත් සංවර්ධනය කිරීමේ සියලු අංශයන් සම්බන්ධයෙන් රජයේ අයිතිවාසිකම් කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීමට ප්‍රතිපාදන සලසා ඇත. එම ප්‍රතිපාදන අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අනුබද්ධ උපසමාගමක් ලෙස ජාතික තෙල් සහ වායු සමාගම සංස්ථාපනය කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මෙම සමාගම මගින් රජයට අමතර මූල්‍ය ආදායමක් මෙන්ම ඛනිජ තෙල් ගවේෂණ ක්ෂේත්‍රයේ දේශීය ශක්‍යතාවය වර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. දිගුකාලීනව ජාතික තෙල් හා වායු සමාගම ලෝකයේ අනෙකුත් රටවල මෙවැනි සමාගම් මෙන් දැවැන්ත සමාගමක් ලෙස කටයුතු කරනු දැකීම තවත් ප්‍රමුඛ අපේක්ෂාවක් වේ.

(ඈ) නව අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ බිම් කොටස් සිතියම ප්‍රකාශයට පත් කිරීම

ජාත්‍යන්තර ගවේෂණ බිම් කොටස් සීමා නිර්ණ ක්‍රියාවලිය, වර්තමාන ආර්ථික හා කර්මාන්ත ප්‍රවනතාවයන් සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය නව අක්වෙරළ සිතියමක් සකස් කළේය. මෙම සිතියම මගින් මන්නාරම, කාවේරි සහ ලංකා ද්‍රෝණිය ආවරණය වන පරිදි කුඩා කොටස් 871කින් සහ විශාල කොටස් තුනකින් සමන්විත වන අතර 2021 ජූලි 22 වැනි දින ගැසට් නිවේදනයක් මගින් සිතියම ප්‍රකාශයට පත් කරන ලදි. මෙම නව බිම් කොටස් සිතියම සකස් කිරීමේ මූලික අභිප්‍රාය වූයේ ඒකාබද්ධ අධ්‍යයන ප්‍රවේශය සඳහා අවශ්‍ය බිම් කොටස් මෙම කුඩා කොටස් සහිත සිතියමින් තෝරා ගැනීමට අවස්ථාව ලබා දීමත් එමගින් කෙටිකාලීනව ගවේෂණ කටයුතු අවසන් කිරීමෙන් ආයෝජන අවධානම අවම කර ගවේෂණ කටයුතු සඳහා ආයෝජන ආකර්ශණය වැඩි කිරීමත්ය.


HYDROCARBON EXPLORATION BLOCK MAP OF SRI LANKA
This map outlines the blocks on offer for Exploration Licenses, Development Licenses and Joint Studies.
INDIA
SRI LANKA
Pedro 1
Delft 1
Palk Bay 1
Pesalai 2
Pesalai 3
Pesalai 1
Pearl 1
M 1
C 1
M 2
Barracuda
Dorado
Dorado north
Wallago
Legend
Cauvery Basin-Blocks (CB001 – CB060)
Lanka Basin-Blocks (LB001 – LB559)
Mannar Basin-Blocks (MB001 – MB252)
Blocks Under Evaluation (M1 & C1)
Block M2 – Available for Appraisal and Development
Location of Exploration Wells
Gas / Condensate Discoveries
Maritime Boundary
0 25 50 100 150 200 Kilometers
Coordinate System: WGS 1984 UTM Zone 44N
Projection: Transverse Mercator
Datum: WGS 1984
False Easting: 500,000.0000
False Northing: 0.0000
Central Meridian: 81.0000
Scale Factor: 0.9996
Latitude Of Origin: 0.0000
Units: Meter
Date: 28/06/2021
Document No: PRDS/E&P/2021/01
Prepared by: Petroleum Resources Development Secretariat (PRDS)
බලශක්ති අමාත්‍යාංශය
வலுசக்தி அமைச்சு
Ministry of Energy

2021 වර්ෂය තුළ ගවේෂණ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද ආයෝජන ව්‍යාපෘති

(ඉ) ගුවන්ගත ගුරුත්වාකර්ෂණ හා චුම්භක ක්ෂේත්‍ර සමීක්ෂණය

එවකට පැවති බනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සහ බෙල් ජියෝස්පේස් (Bell Geospace) සමාගම අතර ඇති කර ගත් බහු-සේවාදායක ගුවන්ගත ගුරුත්වාකර්ෂණ සහ චුම්බක දත්ත අත්පත් කර ගැනීම, සැකසුම, අලෙවිකරණ බලපත්‍ර ගිවිසුම් අනුව ගුවන් සමීක්ෂණය 2021 අගෝස්තු මාසයේදී සිදු කරන ලදි. මෙම සමීක්ෂණය මගින් M1, M2, C1 සහ C2 යන අක්වෙරළ කොටස් ආවරණය වන පරිදි ගුරුත්වාකර්ෂණ රේඛා කිලෝමීටර 14,000 කට ආසන්න චුම්බක දත්ත ලබාගෙන ඇත. M1 හි කුඩා කොටසක් සහ C1 කොටසෙහි සැලකිය යුතු ප්‍රදේශයක් ඉන්දියානු ගුවන් සීමාව තුළ පිහිටා තිබීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ගුවන්ගත ගුරුත්වාකර්ෂණ සහ චුම්බක සමීක්ෂණය සම්පූර්ණ කළ නොහැකි විය. සමීක්ෂණය සඳහා ඉන්දියානු ගුවන් කලාපය භාවිතා කිරීමට අනුමැතිය ඉල්ලා ඇති අතර එම අනුමැතිය ලැබීමෙන් පසු එම කොටස ද ආවරණය කිරීමට අදහස් කරයි. මෙම සමීක්ෂණය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 927,000 ක් පමණ වන අතර එම සියළු වියදම් රජයට කිසිදු වියදමකින් තොරව Bell Geospace සමාගම විසින් දරන ලදී.







(ඊ) බහු සේවාලාභී භූ කම්පන දත්ත ලබා ගැනීම, සැකසීම/නැවත සැකසීම, අලෙවිකරණය සහ බලපත්‍ර ලබා දීමේ වැඩසටහන්

2016 සිට වරින් වර ශ්‍රී ලංකා රජය සමඟ ඇති කරගත් එකඟතාවයන්ට අනුකූලව බහු සේවාලාභී දත්ත ලබා ගැනීම, සැකසීම, නැවත සැකසීම, අලෙවිකරණය සහ බලපත්‍ර ලබා දීමේ වැඩසටහන් ස්ලම්බර්ජර් (Schlumberger) හි අනුබද්ධ සමාගම් විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙමින් පවතී. ඔවුන් 2018 දී අත්පත් කරගත් 2D භූ කම්පන දත්ත සැකසීම අවසන් කර ඇති අතර 2020 සහ 2021 තුළ නවතම මෘදුකාංග සහ ශිල්පීය ක්‍රම භාවිතා කරමින් 2005 සහ 2009 දී ලබාගත් භූ කම්පන දත්ත රේඛා කිලෝමීටර 5100 කට ආසන්න ප්‍රමාණයක් නැවත සකස් කර ඇත. මෙම දත්ත සැකසීමේ ක්‍රියාවලිය තුළින් පවත්නා දත්ත යාවත්කාලීන වන අතර ඒතුළින් දත්තවල විශ්වසනීයත්වය වැඩි වනු ඇත.

(උ) M1 සහ C1 බිම් කොටස් ගවේෂණය කිරීම සහ සංවර්ධනය කිරීම

මන්නාරම් ද්‍රෝණියේ M1 බිම් කොටසෙහි සහ කාවේරි ද්‍රෝණියේ C1 බිම් කොටසෙහි බනිජ තෙල් හා ස්වාභාවික වායු ගවේෂණය කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු 2019 වර්ෂයේ දී කැඳවන ලද අතර එම ලංසු ඇගයීම 2021 මැයි මාසයේදී අවසන් විය. ශ්‍රී ලංකා රජය සමඟ M1 සහ C1 යන බිම් කොටස් සඳහා වෙන වෙනම බනිජ තෙල් සම්පත් ගිවිසුම් (PRA) සඳහා සෙරෙන්ඩිව් පුද්ගලික (Serandive Energy (pvt) Ltd) සමාගම සමඟ සාකච්ඡා 2021 වසර පුරා පවත් වන ලද අතර එම සාකච්ඡා 90% ක් පමණ අවසන් කර ඇත. 2022 වසර මුල් භාගය තුළ අවසන් බනිජ තෙල් සම්පත් ගිවිසුමකට එළඹීමට නියමිතය.

(උ) මන්නාරම් ද්‍රෝණියේ M2 බිම් කොටසෙහි ඩොරාඩෝ (Dorado) ස්වාභාවික වායු නිධිය සංවර්ධනය වේගවත් කිරීම

2011 වර්ෂයේ මන්නාරම් ද්‍රෝණියේ M2 බිම් කොටසෙහි සිදු කරන ලද ගවේෂණ වැඩසටහනක් මගින් සාර්ථක ලෙස "ඩොරාඩෝ" සහ "බැරකුඩා" යන ස්වාභාවික වායු නිධීන් සොයා ගැනීමට සමත් විය. ස්වාභාවික වායු ගවේෂණය හා සංවර්ධනය සඳහා සුදුසු ආයෝජකයෙකු ආකර්ෂණය කර ගැනීමට 2017-2019 අතර කාලය තුළ උත්සාහ කෙරිණි. කෙසේ වෙතත්, 2019 වර්ෂයේ පැවැත්වූ බලපත්‍ර වටය තුළින්ද M2 බිම් කොටසෙහි ස්වාභාවික වායු නිධි සංවර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාකරුවන් එනම් අත්දැකීම් සහිත සාමර්ථ්‍යය ලත් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට අපොහොසත් විය.

එම නිසා ඩොරාඩෝ ස්වාභාවික වායු නිධිය සංවර්ධනය වේගවත් කිරීම සඳහා ශක්‍ය සංවර්ධන විකල්ප හඳුනා ගැනීම සඳහා කෙටි අධ්‍යයනයක් සිදු කිරීම 2021 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදි. මෙම අධ්‍යයනය තුළින් ස්වාභාවික වායු සොයා ගැනීම් වෙළෙඳපොළට ගෙන ඒම සඳහා ආයෝජකයින් හට රජයේ අභිප්‍රාය විදහා දැක්වීම අපේක්ෂා කරනු ලබයි.

(එ) ජාත්‍යන්තර අලෙවිකරණ වැඩසටහන

ගෝලීය ඛනිජ තෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ නිෂ්පාදන ප්‍රජාවේ ප්‍රධාන තීරණ ගන්නන් අතර ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා, ගෝලීය තෙල් සහ ගෑස් කර්මාන්තය සඳහා වෙළඳපල ප්‍රමුඛ, පුවත් මූලාශ්‍රයක් වන Upstream හරහා ජාත්‍යන්තර අලෙවිකරණ ව්‍යාපාරයක් 2021 සැප්තැම්බර් - දෙසැම්බර් මාසයේ දියත් කරන ලදී.

2.2.2 ඉන්ධන ප්‍රවාහන නළ පද්ධතිය සංවර්ධනය කිරීම

නළ මඟින් ඉන්ධන ප්‍රවාහනය, කාර්යක්ෂම මෙන්ම අඩු පිරිවැය මාධ්‍යක් වන අතර ශ්‍රී ලංකාවේ නළ මඟින් ඉන්ධන ප්‍රවාහනය තෙල් නැවක සිට ප්‍රධාන පර්යන්ත වෙත හා පිරිපහදුව වෙත ඉන්ධන ප්‍රවාහනයට සහ පිරිපහදුවේ සිට ගබඩා පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගනු ලබන අතර, සුළු වශයෙන් විදුලිය ජනනය කරන බලාගාර වෙත නළ මඟින් ඉන්ධන ප්‍රවාහනය සිදු කරනු ලබයි.

නළ මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීමේ වාසි සැලකිල්ලට ගෙන තවදුරටත් නළ මාර්ගයෙන් ඉන්ධන ප්‍රවාහනය පුළුල් කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව විදුලිය උත්පාදනය සඳහා අවශ්‍ය ස්වභාවික වායු ප්‍රවාහනයට කෙරවලපිටිය යෝජිත ප්‍රතිවායුකරණ ඒකකයේ සිට කැලණිතිස්ස විදුලි බලාගාරය දක්වා වායු ප්‍රවාහන නළ මාර්ග පද්ධතියක් ඉදිකිරීමට මෙන්ම ගුවන්යානා ඉන්ධන ප්‍රවාහනය සඳහා මුතුරාජවෙල සිට කටුනායක දක්වා කොළඹ කටුනායක අධිවේගී මාර්ගයට සමාන්තරව විශ්කම්භය අඟල් 10ක් වන සහ 22km ක් දිගින් යුක්ත නළ මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කරමින් පවතී.

(ඒ) කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහන නළ පද්ධතිය සංවර්ධනය කිරීම

දැනට පවතින නළ පද්ධති අතරින් ආනයනික ඉන්ධන නිෂ්පාදනවලින් වැඩිම ප්‍රමාණයක් කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා වූ පැරණි නළ පද්ධතිය හරහා ගොඩ බෑම සිදු කරනු ලබන අතර එම නළ පද්ධතියේ දෝෂ හේතුවෙන් ඉන්ධන ප්‍රවාහනයට බාධා ඇති විය. ඉන්ධන ගොඩ බෑමේ කාර්යක්ෂමතාවය පවත්නා නළ පද්ධතියේ ධාරිතාවය හා කාර්යක්ෂමතාවය මත රදා පවතින බැවින්, කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා වූ පවතින නළ පද්ධතිය නවීකරණය සහ ඒ සඳහා අවශ්‍ය නව නළ මාර්ග ඉදිකිරීම සඳහා පහත අදියර දෙක යටතේ පියවර ගන්නා ලදි.

කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා දිවෙන අඟල් 14 ක විශ්කම්භයෙන් යුත් නළ මාර්ගය ප්‍රතිසංස්කරණය

ගොඩබිම් කොටසේ දිග මීටර් 5750 ක් වූ මෙම නළ මාර්ගයේ අලුත්වැඩියා කටයුතු ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මානව සම්පත් යොදවා 2021 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද අතර මේ සඳහා රුපියල් මිලියන 94 ක් පමණ වැය වෙතැයි ගණනය කර ඇත. අවශ්‍ය අරමුදල් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් යොදවනු ලබන අතර 2021 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය 5% ක ප්‍රගතියක් අත් කර ගන්නා ලදි. නළ මාර්ගයේ

අලුත්වැඩියා කටයුතු 2022 වර්ෂය තුළ දී අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර නළ මාර්ගය අලුත්වැඩියා කිරීමෙන් පසු දැවිතෙල් ප්‍රවාහනය පෙරට වඩා කාර්යක්ෂමව සිදු කිරීමට හැකි වනු ඇත.

රට හරහා තෙල් ප්‍රවාහන නළ එළීමේ ව්‍යාපෘතිය

කොළඹ වරායේ සිට කොලොන්නාවේ ඛනිජ තෙල් නිමාව දක්වා භූගත නව නළ මාර්ග පද්ධතියක් ඉදිකිරීම සඳහා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් "රට හරහා නළ මාර්ග එළීමේ ව්‍යාපෘතියට" [Cross Country Pipeline Project (CCPP]ඉ සීමිත තරඟකාරී යෝජනා කැඳවන ලදි. ඉදිරිපත් වූ යෝජනා ඇගයීමෙන් පසු මෙම ව්‍යාපෘතිය මූල්‍යනය සඳහා පිළිගත හැකි මූල්‍ය නියමයන් සහිත උචිත ණය දෙන ආයතනයක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් සොයා ගැනීමට යටත්ව M/S China Petroleum Pipeline Engineering Company Limited වෙත කොන්ත්‍රාත්තුව ප්‍රධානය කරන ලදී.

මේ අතරතුර ද්‍රවීකෘත ස්වාභාවික වායු (LNG) ප්‍රවාහන නළ මාර්ග හා සම්බන්ධ ව්‍යාපෘති ආරම්භ කිරීම, ඛනිජ තෙල් නීති ගත සංස්ථාව විසින් නව පිරිපහදුවක් ඉදිකිරීමට සැලසුම් කිරීම යනාදී සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ විෂය පථය සැලකිය යුතු ලෙස වෙනස් විය යුතු බවට කරුණු ඉදිරිපත් විය. ඒ අනුව සංශෝධිත විෂය පථය යටතේ M/S China Petroleum Pipeline Engineering Company Limited වෙතින් නව මිල යෝජනාවක් ලබා ගනු ලැබූ අතර එම යෝජනාව තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් ඇගයීමට ලක් කරන ලදි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹීම සඳහා නළ පද්ධතියේ මුහුදු අභ්‍යන්තර කොටසේ තත්ත්වය පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

(ආ) මුතුරාජවෙල බෝයාවේ සිට මුතුරාජවෙල පර්යන්තය දක්වා දැවිතෙල් ප්‍රවාහනය කරනු ලබන නළය ඩීසල් ප්‍රවාහනය සඳහා පරිවර්ථනය කිරීම

පවත්නා නළ පද්ධතිය මනා කාර්යක්ෂමතාවයකින් භාවිතයට ගැනීමේ අරමුණ ඇතිව, දැවිතෙල් ප්‍රවාහනය කොලොන්නාව පර්යන්තය මඟින් කළමනාකරණය කිරීමෙන්, මුතුරාජවෙල පර්යන්තය වෙත දැවිතෙල් ප්‍රවාහනය සඳහා භාවිතා කරන ලද අඟල් 18 ක විෂ්කම්භයකින් යුතු නළ මාර්ගය ඩීසල් ප්‍රවාහනයට ගත හැකි වන ආකාරයට පරිවර්තනය කරන ලදි. මෙම පරිවර්තනයත් සමඟ මුතුරාජවෙල පර්යන්තයේ ඩීසල් සහ පෙට්‍රල් පෙරට වඩා කාර්‍යක්ෂමව ගොඩබෑමට හැකි වන අතර එමඟින් ඉන්ධන ගොඩබෑමේදී නැව් සඳහා ගෙවන ප්‍රමාද ගාස්තු අඩු කර ගැනීමට (එක් දිනකට ප්‍රමාද ගාස්තු ඇ.ඩො 18000 ක් පමණ) හැකියාව ලැබිණ.

(ඇ) විදුලිය උත්පාදනය සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වා දීමට ස්වාභාවික වායු ප්‍රවාහන නළ මාර්ග පද්ධතියක් ඉදිකිරීම.

ඛනිජ තෙල් භාවිතයෙන් විදුලිය නිෂ්පාදනයේ දී විදුලිය ඒකකයක් නිෂ්පාදනය සඳහා දැරීමට සිදුවන පිරිවැය ඉහළ අගයක් ගැනීම හා පරිසරයට හරිතාගාර වායුව වැඩි වශයෙන් එකතු වීම හේතුවෙන් විදුලිය නිෂ්පාදනය සඳහා ආදේශකයක අවශ්‍යතාවය මතු විය. ඒ අනුව විදුලි උත්පාදනය සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වා දීමේ ව්‍යාපෘතියක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා විදුලි බල මණ්ඩලය එක්ව සැලසුම්කර ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද මෙම ව්‍යාපෘතිය කොටස් 3 කින් (Floating Storage Regassification Unit (FSRU), Mooring System හා Pipe line) යුක්ත වේ. ලංකා විදුලිබල මණ්ඩලය විසින් FSRU හා Mooring System යන අංගයන් ක්‍රියාත්මක කරන අතර, කෙරවලපිටිය ප්‍රතිවායුකරණ ඒකකයේ සිට කැළණිතිස්ස විදුලි බලාගාරය දක්වා වායු ප්‍රවාහන නළ මාර්ග පද්ධතිය "ඉදිකිරීම, අයිතිකර ගැනීම, ක්‍රියාත්මක කිරීම, පැවරීම" (BOOT) යන ව්‍යාපාර මාදිලිය යටතේ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

නළ මාර්ගය ඉදිකිරීම සඳහා පාර්ශවකරුවන්ගේ මූලික එකඟතාවය ලබාගනු ලැබ ඇති අතර ව්‍යාපෘතියට ආයෝජකයකු තෝරා ගැනීම සඳහා 2021.02.18 දින ව්‍යාපෘති යෝජනා කැඳවන ලදි. ඒ අනුව ලද ව්‍යාපෘති යෝජනා ව්‍යාපෘති කමිටුව විසින් තාක්ෂණික හා මූල්‍ය ඇගයීම සිදු කරන ලද අතර ව්‍යාපෘති යෝජක සමඟ තාක්ෂණික සාකච්ඡා සිදු කරමින් පවතී. නළ මාර්ගය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ කටයුතු

ආරම්භ කර ඇති අතර ව්‍යාපෘතිය 2023 වසර තුළ නිම කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘති ඇස්තමේන්තු ගත පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 40 ක් වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලංකා විදුලිබල මණ්ඩලයට වාර්ෂිකව රුපියල් බිලියන 42 ක් පමණ ඉතිරි වෙතැයි ගණනය කර ඇත.

(ඈ) ගුවන් යානා ඉන්ධන ප්‍රවාහනය සඳහා නළ මාර්ගයක් සහ නව ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව ශ්‍රී ලංකාව තුළ එකම ගුවන් යානා ඉන්ධන සැපයුම් කරුවා වන අතර මෙම වෙළෙඳාම තුළින් විදේශ විනිමය ඉපයීම ද සිදු කරනු ලබයි. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මගින් ජාතික හා ජාත්‍යන්තර ගුවන් යානා සඳහා වැඩි වශයෙන් ඉන්ධන සැපයීම සිදු කරනු ලබන අතර වසර 2014 දී ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම පත් කරන ලද Japan Airport Consultants INC ආයතනය විසින් ගණනය කර ඇති ආකාරයට 2014 වසරේ දී ලීටර් මිලියන 1.2 ක් වූ දිනකට ඉන්ධන ඉල්ලුම 2027 වසර වන විට ලීටර් මිලියන 3 දක්වා වැඩි වේ යැයි අපේක්ෂිතය. මෙම වැඩි වන ඉල්ලුම කාර්යක්ෂමව සපුරාලීම සඳහා මුතුරාජවෙල ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තයේ ඝණ මීටර් 92,000 ක මුළු මෙහෙයුම් ධාරිතාවයකින් යුත් ටැංකි සංකීර්ණයක් සහ මුතුරාජවෙල සිට කටුනායක දක්වා කොළඹ කටුනායක අධිවේගී මාර්ගයට සමාන්තරව විශ්කම්භය අඟල් 10ක් වන සහ 22km ක් දිගින් යුක්ත නළ මාර්ග යක් ඉදිකිරීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කොන්ත්‍රාත්කරුවකු තෝරා ගන්නා ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො.මිලියන 46.3 ක් වන අතර ආරම්භයේදී මේ සඳහා අරමුල් යෙදවීමට ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව අපේක්ෂා කළ ද වර්තමානයේ පවතින මූල්‍ය තත්ත්වය හේතුවෙන් ඒ සඳහා අරමුදල් විදේශ බැංකුවකින් ණයක් ලෙස ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමට කටයුතු කරමින් පවතී.

2.2.3 දුම්රිය මඟින් ඉන්ධන ප්‍රවාහනය ශක්තිමත් කිරීමේ වැඩසටහන

දුම්රිය මඟින් ඉන්ධන ප්‍රවාහනය, බවුසර් රථ මඟින් ඉන්ධන ප්‍රවාහනයට සාපේක්ෂව අඩු පිරිවැයකින් සිදු කිරීමට හැකියාව ඇති අතර, මේ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගබඩා කිරීම හා බෙදාහැරීම පිලිබඳ විශේෂ විගණන වාර්තාව මගින් ද පෙන්වා දී ඇත. එම වාර්තාවට අනුව දුම්රිය වැගන් මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීමට සාපේක්ෂව බවුසර් රථ මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීමෙන් 200% ක පමණ වැඩි පිරිවැයක් දැරීමට සිදු වේ. ඒ අනුව සාමාන්‍යයෙන් 30%ව පැවති දුම්රිය මගින් ඉන්ධන ප්‍රවාහනය 2023 දී 60% දක්වා වර්ධනය කිරීම සඳහා සැලසුම් කරන ලදී. කෙසේ වෙතත් එක් තනි මාධ්‍යක් මත වැඩි ප්‍රතිශතයක් ප්‍රවාහනය කිරීමේ දී එම මාධ්‍යයේ ඇතිවන බිඳ වැටීමක් සෘජුවම ඉන්ධන ප්‍රවාහනයට බලපාන බැවින් ඒ පිළිබඳ සැලකිල්ලට ගෙන දුම්රිය මඟින් ඉන්ධන ප්‍රවාහනය 40% දක්වා පමණක් වර්ධනය කිරීමට තීරණය කරන ලදී.

මේ වන විට දුම්රිය මඟින් ඉන්ධන ප්‍රවාහනය 38% ක් දක්වා වර්ධනය කර ඇති අතර තවදුරටත් අපේක්ෂිත ඉලක්කය වන 40% ක ප්‍රමාණය දුම්රිය මගින් ප්‍රවාහනය සඳහා අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය ද ප්‍රවාහන අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් සිදු කරමින් පවතී. ඒ අනුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොලොන්නාව පර්යන්තයේ පවත්නා දුම්රිය මාර්ග පද්ධතිය දුම්රිය දෙපාර්තමේන්තුව මගින් නවීකරණය සඳහා කටයුතු ආරම්භ කරන ලද අතර මේ සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 80 කි.

2.2.4 ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම හා සම්බන්ධ ව්‍යාපෘති

ඉන්ධන ගබඩා කිරීමේ ධාරිතාවය රටක ඉන්ධන සුරක්ෂිතතාවය පෙන්නුම් කරනු ලබන ප්‍රධාන සාධකයකි. වර්තමානයේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යටතේ මෙහෙයවන කොලොන්නාව පර්යන්තයේ මෙ.ටො. 240,000 ක ධාරිතාවයකින් ද මුතුරාජවෙල පර්යන්තයෙන් මෙ.ටො. 200,000 ක ධාරිතාවයකින් ද ලංකා ඛනිජ තෙල් නීතිගත

සංස්ථාව යටතේ මෙහෙයවන සපුගස්කන්ද පර්යන්තයේ මෙ.ටො. 64,000 ක ධාරිතාවකින් ද ලංකා ඉන්දියන් තෙල් සමාගම යටතේ මෙහෙයවන ත්‍රිකුණාමලය මෙ.ටො. 150,000 ක ධාරිතාවයකින් ද වශයෙන් සමන්විත මෙ.ටො. 654,000 ක ඉන්ධන ගබඩා පහසුකම් රට තුළ පවතී.

ඉන්ධන සඳහා වන ඉල්ලුම ක්‍රමිකව වර්ධනය වෙමින් පැවතියද, පවත්නා ගබඩා ධාරිතාව යටතේ ඛනිජතෙල් නිෂ්පාදනයකට අදාළව ඇණවුම් කළ තොග රැගෙන ඊළඟ නැව පැමිණීමේ දී පවතින තොගය ප්‍රමාණවත් වනුයේ ඉතා සීමිත දින ගණනකටය. අපේක්ෂිත නැව ප්‍රමාදවීම හෝ තත්ත්වයෙන් බාල නිෂ්පාදන ලැබීම මත තොගය ප්‍රතික්ෂේපවීම සිදුවුවහොත් අඛණ්ඩව ඉල්ලුම සපුරාලීම අභියෝගාත්මක වී තිබේ. එබැවින් රටේ අඛණ්ඩ ඉන්ධන සැපයුම් ක්‍රියාවලිය බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාමට හැකිවනු පිණිස රටෙහි දෛනික ඛනිජ තෙල් අවශ්‍යතාවය ඕනෑම අවස්ථාවක දින 30 කට ප්‍රමාණවත්ව පවත්වාගෙන යාමට හැකිවන පරිදි ගබඩා ධාරිතාවය පුළුල් කිරීමට තීරණය කරන ලදි. ඒ සඳහා උපක්‍රම කිහිපයක් ඔස්සේ කටයුතු කරනු ලැබේ. එනම් නව ටැංකි ඉදි කිරීම, පවත්නා ටැංකි නවීකරණය සහ මෙතෙක් ඌණ උපයෝජිතව පැවති ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය උපයෝජනය සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.

(අ) නව ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය

පවත්නා ඉන්ධන ගබඩා ධාරිතාවය ඝණ මීටර් 93000 න් පුළුල් කිරීම සඳහා නව ඉන්ධන ටැංකි 09 ක් ඉදිකිරීම අදියර 02ක් යටතේ ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘති දෙක ඉන්ධන ගබඩා කිරීමේ ප්‍රධාන වගකීම දරන ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය දායකත්වයෙන් සහ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඝණ මීටර් 29000 ක සමස්ත ධාරිතාවයකින් යුතු ටැංකි 3 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඝණ මීටර් 29000 ක ධාරිතාවයකින් යුතු නව ටැංකි 3 ක් කොලොන්නාව ඛනිජතෙල් තොග ගබඩා පර්යන්තයේ ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂයේ අවසන් භාගයේ ආරම්භ කරන ලද අතර 2022.07.12 ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතය. ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රුපියල් 942,474,240.25 ක බදු රහිත මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති අතර 2021.12.31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය 69% කි. ව්‍යාපෘතිය නියමිත සැලසුමට අනුව ක්‍රියාත්මක වෙමින් පවතී.

ඝණ මීටර් 64000 ක සමස්ත ධාරිතාවයකින් යුතු ටැංකි 6 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඝණ මීටර් 64000 ක ධාරිතාවයකින් යුතු ටැංකි 6 ක් කොලොන්නාව පර්යන්තයේ ඉදිකිරීමේ කටයුතු 2019 වර්ෂයේ අවසන් භාගයේ ආරම්භ කරන ලද අතර 2023.02.24 ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතය. ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රුපියල් 2,049,245,013.21 ක බදු රහිත මිලකට







ජාත්‍යන්තර තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2022.01.19 දින අත්හිටවන ලදී. 2021.12.31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය 18% කි.

(අ) පවත්නා ටැංකි නවීකරණය හා අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

පවත්නා ගබඩා ධාරිතාවය ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා ඉතා පැරණි තත්ත්වයේ පවත්නා ටැංකි අලුත්වැඩියා කිරීම හා නවීන තාක්ෂණයට අනුකූලව නවීකරණය කිරීම අත්‍යාවශ්‍ය වන අතර, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අරමුදල් යොදවමින් එම කටයුතු 2021 වර්ෂය තුළද අඛණ්ඩව සිදු කරන ලදි. 2021 වසර තුළ අලුත්වැඩියා කටයුතු අවසන් කරන ලද ටැංකි පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ටැංකි අංකය	ටැංකි ධාරිතාව **(m3)**
ටැංකි අංක 14	1805
ටැංකි අංක 47	11683
ටැංකි අංක 46	11856
ටැංකි අංක 03	12500
ටැංකි අංක 23	3293

(ඇ) ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම

රටේ ඛනිජ තෙල් සම්පාදන ක්‍රියාවලියට ඉතා පහසුවෙන් උපයෝගී කර ගත හැකි ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව තෙල් ටැංකි 99 ක් පිහිටා ඇති අතර මෙම සම්පත ඌණ උපයෝජනව පවතී. එබැවින් එම තෙල් ටැංකි සංකීර්ණය නවීකරණය කර ඵලදායීව භාවිතයට ගැනීම සඳහා ඉන්දියාව සමඟ ආරම්භ කරන ලද රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා 2021 වසර තුළ සාර්ථකව අවසන් කිරීමට හැකියාව ලැබිණ.

ඒ අනුව ටැංකි සංකීර්ණයේ ටැංකි 24 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ද, ටැංකි 14ක් ලංකා අයි.ඕ.සී. සමාගම විසින් ද, සහ ඉතිරි ටැංකි 61 ලංකා අයි.ඕ.සී. සමාගම හා ඒකාබද්ධව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ උප සමාගමක් ලෙස පිහිටු වන ලද "ත්‍රිකුණාමලය ඛනිජ තෙල් පර්යන්ත සමාගම" විසින් ද සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි (21/2285/325/050 දරන 2022.01.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි). ඒ අනුව මෙම තෙල් ටැංකි සංකීර්ණයේ සංවර්ධන කටයුතු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරමින් ඇති අතර ඉදිරි වසර කිහිපය තුළ සංවර්ධන කටයුතු අවසන් කිරීමට අපේක්ෂිතය.

2.2.5 ඉන්ධන පිරිපහදු ධාරිතාවය පුළුල් කිරීම සඳහා නව පිරිපහදුවක් ඉදිකිරීම සහ පවත්නා පිරිපහදුව නවීකරණය

ශ්‍රී ලංකාවේ දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 25%ක් පමණ සපුගස්කන්ද පිරිපහදුව මගින් සපයනු ලබන අතර විදේශ විනිමය මත වැඩි බලපෑමක් ඇති කරමින් ඉතිරි 75% ක් වූ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් ප්‍රමාණය ආනයනය කිරීමට සිදුව ඇත. 2026 වන විට රටේ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම මෙරට පිරිපහදු මඟින් නිපදවීම අපගේ ප්‍රධාන අරමුණක් වන අතර ඒ සඳහා දිනකට බැරල් (bb/spd) 100,000 ක ධාරිතාවයකින් යුතු නව පිරිපහදුවක් ඉදිකර, මෙහෙයවා, පැවරීමේ පදනමින් (Build" Oparate and Transfer) ඉදිකිරීමටත් පවත්නා පිරිපහදුවේ ධාරිතාව දිනකට බොරතෙල් බැරල් 45,000 දක්වා වැඩි කිරීම සඳහා නවීකරණය කිරීමටත් සැලසුම් කරන ලදි. ඒ සඳහා වන ශක්‍යතා අධ්‍යයනය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2021 වර්ෂය තුළ අවසන් කරන ලද අතර ශක්‍යතා අධ්‍යයනය තුළින් පහත වාර්තා ඉදිරිපත් කරන ලදි.

- ශක්‍යතා අධ්‍යයන වාර්තාව (Feasibility report)
- යෝජනා කැඳවීම් කෙටුම්පත (Draft RFP document)
- Configuration report
- වෙළඳපොල සමීක්ෂණ වාර්තාව (Market survey report)

පිරිපහදුව ඉදිකිරීම සඳහා භූමිය පවරා ගැනීම සම්බන්ධයෙන්, පවරා ගැනීමට අපේක්ෂිත භූමි තුළ පදිංචිකරුවන්ගේ කැමැත්ත පිළිබඳ ප්‍රජා සමීක්ෂණයක් ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව විසින් සිදු කරන ලද අතර,

සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉඩම් පවරා දීම සඳහා පදිංචිකරුවන් 80% ක් පමණ කැමැත්ත ප්‍රකාශ කරන ලදි. ඒ අනුව නව පිරිපහදුව ඉදිකිරීම සඳහා අවශ්‍ය අමතර භූමි ප්‍රමාණය පවරා ගැනීමේ ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉඩම් අමාත්‍යාංශය හා ඒකාබද්ධව ආරම්භ කර ඇත.

නව පිරිපහදුව ඉදිකිරීමෙන් පසු දේශීයව සියළු ඛනිජ තෙල් වර්ග සඳහා ඇති ඉල්ලුම පූර්ණ වශයෙන් රට තුළ පිරිපහදුකර සැපයීමට හැකියාව ලැබෙනු ඇත. පිරිපහදු නිෂ්පාදන වශයෙන් ආනයනය කිරීම වෙනුවට බොරතෙල් ආනයනයකර පිරිපහදු කිරීම තුළින් බැරලයකට ඇ.ඩො. 08 ක් පමණ ඉතිරි කරගත හැකි බව ඇස්තමේන්තු කර ඇත. තවද නව පිරිපහදුවේ නිෂ්පාදනවල ප්‍රමිතිය යුරෝ VI හෝ ඊට වැඩි අගයකට ඉහළ නැංවීම තුළින් ඉහළ ගුණාත්මක බවකින් යුත් ඉන්ධන දේශීය වෙළෙඳපොළට සැපයීමට හැකියාව ලැබෙනු ඇත.





2.2.6 ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කිරීම

නිරතුරුව විචලනය වන ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන්, දේශීය ඉන්ධන මිලෙහි කෙටිකාලීන උච්ඡාවචනයන් ඇති කිරීමට බලපාන්නාවූ ප්‍රමුඛතම හේතු සාධකයකි. එබැවින් දේශීය වෙළෙඳපොළේ ඉන්ධන මිල ස්ථාවරව පවත්වාගනිමින් පාරිභෝගිකයාට මෙන්ම රජයට සාධාරණය වන ආකාරයේ ඉන්ධන වෙළඳපොළ සුමට ක්‍රියාකාරිත්වයකට ඉඩ සලසන මෙවලමක අවශ්‍යතාවය පැන නගින ලදි. ඒ අනුව ජාත්‍යන්තර වෙළඳපොළේ සිදුවන මිල විචලනයන්ගේ බලපෑම අවශෝෂණය කරගත හැකි ආකාරයේ පූර්ව ස්ථාපිත මූල්‍ය සංචිත සමුච්චනය හා බෙදාහැරීමේ ක්‍රමවේදයක් හරහා ඉන්ධන මිල විචලනය වඩාත් සුමට කිරීමට, ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලක් මෙම අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ පිහිටුවීමට අංක 21/1847/325/004-II දරන 2021.11.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා ගන්නා ලදි.

ඒ අනුව ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල නිසි නියාමනයකට යටත්ව විනිවිදභාවයකින් පවත්වා ගැනීමට අදාලව සුදුසු විධිවිධාන ඇතුළත් කිරීම සඳහා 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතට අවශ්‍ය සංශෝධන කෙටුම්පත් කර අනුමැතිය සඳහා 2022.02.17 දින අමාත්‍යමණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. මෙම අරමුදල කඩිනමින් පිහිටුවීම සඳහා අවශ්‍ය අනෙකුත් කටයුතු සම්පාදනය කරමින් පවතී. අරමුදල ක්‍රියාත්මක කිරීමෙන් දේශීය ඉන්ධන මිල ස්ථාවරව පවත්වාගෙන යාම අපේක්ෂා කරනු ලැබේ.

2.2.7 ගුවන් යානා ඉන්ධන සැපයුම් පද්ධතිය (Fuel Hydrant System) ඉදිකිරීම

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ජෙට් ඒ 1 ගුවන් යානා ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම, ඉන්ධන සැපයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි II වන අදියරේ 2 වන පියවරේ සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව මෙම ව්‍යාපෘතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආරම්භ කරන ලදි. ව්‍යාපෘති ඇස්තමේන්තු ගත පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 51.5 කි. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 2021.12.31 දිනට 65%ක් විය. 2021 වර්ෂයේ දී මෙහි වැඩ අවසන් කිරීමට නියමිත වුවද COVID 19 වසංගතයේ ගෝලීය බලපෑම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2022 මැයි මස දක්වා දීර්ඝ කිරීමට සිදු විය.









2.2.8 දේශීය බලශක්ති මිශ්‍රණයට විකල්ප ඉන්ධන හඳුන්වාදීමේ වැඩසටහන

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීම බලශක්ති අමාත්‍යාංශයේ විෂය පත අතර වන බැවින්, 2050 දී ශුද්ධ කාබන් විමෝචනය ශූන්‍ය බවට ශ්‍රී ලංකාව පත්කිරීමේ අරමුණ පෙරදැරිව පොසිල ඉන්ධන භාවිතයේ සිට පිවිතුරු බලශක්ති ප්‍රභවයන් දෙසට ශ්‍රී ලංකාවේ බලශක්ති මිශ්‍රණය ක්‍රමිකව යොමු කිරීමේ කාර්යභාරයට බලශක්ති අමාත්‍යාංශයද වැඩසටහන් සම්පාදනය කරන ලදී. ඒ අනුව හරිත හයිඩ්‍රජන් සහ ජීව ඉන්ධන බලශක්ති මිශ්‍රණයට හඳුන්වා දීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(අ) හරිත හයිඩ්‍රජන් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

හරිත හයිඩ්‍රජන් ශ්‍රී ලංකාවේ බලශක්ති මිශ්‍රණයට හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු බලශක්ති අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් 2021 වසර තුළ ආරම්භ කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස නෝර්වේහි Greenstat ආයතනයේ උපසමාගමක් වන Greenstat Hydrogen India පුද්ගලික සමාගම පාවෙන සූර්ය හා සුලං සංයෝගයක් භාවිතා කරමින් හරිත හයිඩ්‍රජන් ජනනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් දක්වා යොමු කළ හැකි ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීම සඳහා ද්විපාර්ශ්වික ගිවිසුමක් 2022.02.28 දින අත්සන් තබන ලදි. මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමෙන්, වර්ධනය වන ගෝලීය හරිත හයිඩ්‍රජන් වෙළෙඳපොළට ශ්‍රී ලංකාවට ප්‍රවේශයක් ලබා ගත හැකි වනු ඇත.

(ආ) ජීව ඉන්ධන හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

දේශීය බලශක්ති මිශ්‍රණයට ජීව ඉන්ධන හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික සාකච්ඡා පර්ශවකරුවන් සමග 2021 වසර තුළ ආරම්භ කරන ලද අතර සාකච්ඡා මේ වන විටත් අඛණ්ඩව සිදු කරමින් පවතී. ජීව ඉන්ධන ප්‍රවර්ධනය මඟින් රටතුළ පවතින මෙතෙක් ඵලදායීව භාවිතයට නොගත් සම්පත් යොදා ගනිමින් ජීව ඉන්ධන නිෂ්පාදනය කිරීමටත්, විදේශ විනිමය රට තුළ ඉතිරි කර ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත.

2.2.9 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන ප්‍රසම්පාදනය, ආනයනය, සහ අලෙවිය

(අ) 2021 වර්ෂයේ ඉන්ධන ප්‍රසම්පාදනය

ජාතික ඉන්ධන අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදනවලින් වැඩිම ප්‍රමාණය ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව ආනයනය කර සපයනු ලබේ. 2021 වසරේ රට තුළ පැවති

කෝවිඩ් 19 තත්ත්වය හා විදේශ විනිමය දුෂ්කරතා හමුවේ, අවම පිරිවැයක් යටතේ රටේ අඛණ්ඩ ඉන්ධන සැපයුම තහවුරු කිරීම සඳහා අමාත්‍යාංශය සහ ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව කැපවී කටයුතු කරන ලදි.

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් ඇගයීම් කර ඉතා සුපරීක්ෂාකාරී ක්‍රමවේදයක් යටතේ සිදු කරනු ලැබේ. ඛනිජ තෙල් ආනයනය දිගුකාලීන කොන්ත්‍රාත් හරහා සිදුකරන ලද අතර පුරෝකථනය කළ නොහැකි ඉල්ලුමක් හෝ බලාපොරොත්තු නොවූ වාතාවරණයක් හේතුවෙන් සහ දිගුකාලීන කොන්ත්‍රාත්තු ඇතැම් විශේෂ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ක්‍රියාත්මක කළ නොහැකි විට ඛනිජ තෙල් නිෂ්පාදන තනි නැව් තොග (single cargo) ලෙස මිලට ගැනීම සිදු කරන ලදි. ඒ අනුව, 2021 වසරේදී ඉන්ධන අවශ්‍යතාවය සපුරාලීම සඳහා දිගුකාලීන කොන්ත්‍රාත් ක්‍රමවේදය යටතේ නැව් තොග 61 ක් ද, තනි නැව් තොග 39 ක් ද ලෙස පහත පරිදි ඉන්ධන ආනයනය සඳහා CPC ආයතනයට අවසර ලබා දෙන ලදි.

ඉන්ධන වර්ගය	ප්‍රමාණය (මෙ.ටො)
බොරතෙල්	1,130,237.000
පෙට්‍රල් (92 UNL)	918,458.994
පෙට්‍රල් (95 UNL)	103,127.545
ඩීසල් (0.05% M.S.)	1,287,415.372
ඩීසල් (0.001% M.S.)	67,673.868

(ආ) ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාවේ ඉන්ධන ආනයනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්තවලට අනුව දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2021 වසර තුළ ඉන්ධන ආනයනය (බොරතෙල් සහ පිරිපහදු කළ ඉන්ධන) සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 3465.1 ක් පමණ වැය කර ඇති අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2021 වසර තුළ ප්‍රධාන ඉන්ධන වර්ග 08 ක් සහ බොරතෙල් ආනයනය සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 2393 ක් පමණ වැය කරන ලදි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2021 වසර තුළ එක් එක් ඉන්ධන වර්ගය ආනයනය කළ ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද පිරිවැය පහත වගුව මගින් සවිස්තරාත්මකව දක්වා ඇත.

ඉන්ධන වර්ගය	ප්‍රමාණය (මෙ.ටො.)	පිරිවැය (ඇ.ඩො)
ඔටෝ ඩීසල් (500 PPM)	1,495,670.14	754,970,918.50
සුපර් ඩීසල් (10 PPM)	67,673.88	81,388,037.51
පෙට්‍රල් 92	918,459.00	640,302,567.37
පෙට්‍රල් 95	103,127.56	73,980,353.64
ජෙට් A-1	178,099.59	119,982,151.29
දැවිතෙල් තෙල් 180 CST(1.8S)	183,525.17	95,311,722.44
අඩු සල්ෆර් දැවිතෙල් 180 CST(0.5S)	30,391.28	14,591,036.33
වැඩි සල්ෆර් දැවිතෙල් 180 CST(0.5S)	31,488.81	16,147,569.52
බොර තෙල්	1,130,237.00	596,945,601.91
එකතුව	-	**2,393,619,958.51**

මූලාශ්‍රය: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

ඉහත දත්ත අනුව වැඩිම ආනයන පිරිවැය ලංකා ඔටෝ ඩීසල් ආනයනය සඳහා එනම් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 755 ක් පමණ වැය කර ඇති අතර ඊළඟට වැඩිම පිරිවැය පෙට්‍රල් (ඔක්ටේන් 92) සහ බොරතෙල් ආනයනය සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 640 ක් සහ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 596 ක් පමණ පිළිවෙලින් වැය කර ඇති බව පෙනී යයි.

(ඇ) ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාවේ ඉන්ධන අලෙවිය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රවාහන, විදුලිය නිෂ්පාදනය, කර්මාන්ත සහ ගෘහස්ථ යන අංශ වෙත ඉන්ධන අලෙවිය සිදු කරන අතර 2021 වසර තුළ පහත පරිදි ඉන්ධන අලෙවිය සිදු කරන ලදි.

2021 වසර තුළ ඔටෝ ඩීසල් ලීටර් 2,016,541,380 ක් සහ පෙට්‍රල් (ඔක්ටේන් 92) ලීටර් 1,448,752,995 ක් ලෙස වැඩිම අලෙවියක් වාර්තා කර ඇත. විදුලිය

නිෂ්පාදනය සඳහා ඔටෝ ඩීසල්, දැව් තෙල් සහ නැප්තා ලීටර් මිලියන 610 ක් සම්පාදනය කරන ලද අතර එහි වටිනාකම රුපියල් මිලියන 60,549 විය.

ඉන්ධන වර්ගය	2021 වසර තුළ අලෙවිය (ලීටර්)
පෙට්‍රල් - 92 ඔක්ටේන්	1,448,752,995
පෙට්‍රල් - 95 ඔක්ටේන්	135,091,729
ඔටෝ ඩීසල්	2,016,541,380
සුපර් ඩීසල්	77,682,856
භූමිතෙල්	235,902,969
කාර්මාන්ත භූමිතෙල්	3,695,890
රසායනික නැප්තා	470,243,027
දැව් තෙල් 800	104,784,493
දැව් තෙල් 1500 (වැඩි සල්ෆර්)	358,908,853
දැව් තෙල් 1500 (අඩු සල්ෆර්)	430,301,108
ජෙට් ඒ-1	282,714,170
ලංකා සොල්වන්ට් (SBP)	3,650,200

මූලාශ්‍රය: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

2.2.10 ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන් පහසුකම් සැලසීම

ලිහිසි තෙල්, තාර සහ නැව් තෙල් කර්මාන්තය නියාමනය මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ අනුව ක්ෂේත්‍රයේ නිරත කර්මාන්ත කරුවන් / සැපයුම්කරුවන් හට බලපත්‍ර ප්‍රදානය කිරීම, ආනයන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, නිෂ්පාදන සඳහා ප්‍රමිතීන් හඳුන්වා දීම යනාදී කටයුතු 2021 වසර තුළ දී සිදු කරන ලදි.

(අ) ලිහිසි තෙල් කර්මාන්තය

ලිහිසි තෙල් කර්මාන්තය නියාමනය මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ලද නව බලපත්‍ර ලබාදීමේ වැඩසටහනෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව තුළ 2021 වර්ෂය ආරම්භ වන විට ආයතන 18 ක් විසින් සන්නාම 29ක් යටතේ වූ ලිහිසි තෙල් අලෙවි ජාලය 2022 වසරේ අප්‍රේල් මාසය වන විට මෙරට ලිහිසි තෙල් කර්මාන්තයේ නියැලීමට සුදුසුකම් ලද ආයතන සංඛ්‍යාව 27 දක්වා වර්ධනය විය. 2021 වසරේ මෙරට ලිහිසි තෙල් කර්මාන්තයේ අභිවෘධිය සඳහා ගනු ලැබූ සාධනීයම පියවර වන්නේ මෙරට භාවිතා වන ලිහිසි තෙල් සඳහා ජාත්‍යන්තරව පිළිගැනෙන අවම ප්‍රමිතිකරණයක් හඳුන්වා දීමයි. තවද 2022 වර්ෂයේ සිට ක්‍රමවත් වැඩපිළිවෙළක් යටතේ ආනයනික ලිහිසි තෙල් අනිවාර්ය පරීක්ෂාවකට ලක්කිරීමත් මෙරට වෙළෙඳපළ තුළ සංසරණය වන ව්‍යාජ නිෂ්පාදන සහ ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කොට ඇත. තවදුරටත් මෙරට ලිහිසි තෙල් කර්මාන්තයේ ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම සහ අභිවර්ධනය සඳහා බලශක්ති අමාත්‍යාංශය කැපවෙමින් සිටී.

ශ්‍රී ලංකාව තුළ භාවිතයෙන් ඉවතලන ලිහිසිතෙල් නැවත ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට ප්‍රති පිරිපහදු කිරීම මඟින් හයිඩ්‍රොකාබන් නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ වාර්ෂික ලිහිසි තෙල් පරිභෝජනය කිලෝ ලීටර් 65,000 ක් පමණ වන අතර, විධිමත් ලෙස භාවිතයෙන් පසුව අපද්‍රව්‍යයක් ලෙස ඉවතලන ලිහිසි තෙල් වසර ගණනක් තිස්සේ ජල මූලාශ්‍රවලට එකතු වීමෙන් ජල දූෂණය ද, පසට එකතුවීමෙන් පසෙහි සංඝටකවලට හානි සිදුවීම ද මඟින් දැඩි පාරිසරික හානි හට ගනී. එබැවින් මෙලෙස භාවිතයෙන් පසු මුදාහැරෙන තෙල් ප්‍රති පිරිපහදු ක්‍රියාවලියක් තුළින් නැවත පරිහරණයට ගැනීම කෙරෙහි බලශක්ති අමාත්‍යාංශයේ අවධානය යොමු කරන ලදි.

විධිමත් ඇගයීම් හා නියාමන ක්‍රියාවලියක් යටතේ පාරිසරික හා සෞඛ්‍යමය හානි අවමවන පරිදි අපද්‍රව්‍ය තෙල් ප්‍රති-පිරිපහදු කර ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීමට අවස්ථාව සලසා දීම උදෙසා, මේ සම්බන්ධව උනන්දුවක් දක්වන දේශීය ආයෝජකයන්ගෙන් අභිලාෂය ප්‍රකාශ කිරීමේ යෝජනා කැඳවන ලදි. මෙම යෝජනා ඇගයීමෙන් පසුව විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා කැඳවීමට මෙම වසර තුළ දී කටයුතු කරනු ලැබේ.

(ආ) තාර වෙළඳාම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පිරිපහදුව මඟින් තාර නිෂ්පාදනය සිදු කරන අතර එය දේශීය ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවන බැවින් පිළිගත් නිර්ණායක මත පදනම්ව පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතනවලට තාර ආනයනය කිරීම සඳහා අමාත්‍යාංශය

අවසර ලබා දෙනු ලැබේ. ඒ අනුව 2021 වර්ෂය තුළ තාර මෙට්‍රික් ටොන් 280,500 ක් ආනයනය කිරීමට ආයතන 23ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

2021 වසර තුළ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තාර නිෂ්පාදන දායකත්වය පහත පරිදි වේ.

තාර වර්ගය	ප්‍රමාණය
තාර තොග 80/100	කි. ග්‍රෑ. 981,460
තාර තොග 60/70	108 බැරල්
තාර බැරල් 60/70 තොග	කි. ග්‍රෑ. 5,950,220

(ඇ) නැව් තෙල් වෙළඳාම

නැව් තෙල් වෙළඳාම රටට විදේශ විනිමය සපයන ප්‍රධාන අංශයක් වන අතර මෙම අංශය සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු වී ඇත. නැව් තෙල් වෙළඳාමේ නිරත වීම සඳහා අවශ්‍ය අධිකාරී බලය මෙම අමාත්‍යාංශය විසින් ලබාදෙනු ලබන අතර 2022 වර්ෂය සඳහා ආයතන 13 ක් වෙත නැව් තෙල් වෙළඳාමේ නිරත වීම සඳහා වන අධිකාරී බලය ලබාදී ඇත. 2021 වර්ෂය තුලදී නැව් තෙල් මෙට්‍රික් ටොන් 594,362ක් පමණ ආනයනය කර ඇති අතර 2022 වර්ෂයේ පළමු මාස 02 තුළ එම අගය 131,778.ක් වේ.

විදුලි බලාගාරවලට අලෙවි කරන ලද ඉන්ධන ප්‍රමාණයන් - 2021



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නැව්තෙල් ආනයනය - 2021



මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

බොරතෙල් සඳහා ප්ලැට්ස් මිල ගණන් 2021



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන වියදම



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

විනිමය අනුපාතික චලිතය - ඇමරිකානු ඩොලර් සඳහා රුපියල්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා ලංකා ඔබබැංකුව

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන අලෙවිය 2021



මූලාශ්‍රය: ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන මිල ගණන්



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.3 අනාගත අපේක්ෂා

"සෞභාග්‍යයේ දැක්ම" රජයේ වැඩ පිළිවෙළට අනුව ශ්‍රී ලංකාව ආසියාවේ බලශක්ති කේන්ද්‍රස්ථානය බවට පත්කිරීම අරමුණු කරගෙන අමාත්‍යාංශය කටයුතු කරන අතර බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කරමින් රට බලශක්තියෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා පහත වැඩසටහන් ඉදිරි වසර කිහිපය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

(අ) දේශීය ඛනිජ තෙල් හා ස්වභාවික වායු ගවේෂණය කඩිනම් කිරීම.

මන්නාරම් ද්‍රෝණියේ ඇති බවට සොයාගෙන ඇති ස්වභාවික වායු ඉදිරි වසර කිහිපය තුළ දේශීය පාරිභෝජනයට ගත හැකි වන පරිදි සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර අමාත්‍යාංශය විසින් ගනිමින් ඇත. දිගු කාලයක් උද්ගාමී ඛනිජ තෙල් කර්මාන්තය අපේක්ෂාවෙන් සිටි නීතිමය හා ආයතනික රාමුව සහතික කිරීමේ පියවර ලෙස 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම, ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීම, ජාතික තෙල් සහ වායු සමාගම ස්ථාපිත කිරීම සඳහා මූලික පියවර ගැනීම, නව ගවේෂණ බිම්කොටස් සිතියමක් ප්‍රකාශයට පත් කිරීම, නව රෙගුලාසි කෙටුම්පත් කිරීම වැනි ප්‍රධාන කාර්යන් 2021 වසර තුළ දී ඉටු කරන ලදි.

ඉදිරියේදී අදාළ රෙගුලාසි බලාත්මක කිරීමෙන් පසු, ජාත්‍යන්තරව නව ගවේෂණ බිම් කොටස් වෙළඳපොළට ගෙන ඒම සඳහා ජාත්‍යන්තර අලෙවිකරණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමටත්, ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම් කිහිපයකට එළැඹීමටත්, 2022 තුළ එකඟ වූ කොටස්වල ගවේෂණ කටයුතු ආරම්භ කිරීමටත් අපේක්ෂා කෙරේ.

(ආ) දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන අවශ්‍යතාවය 2026 වන විට දේශීය පිරිපහදු මඟින් පිරිපහදු කර සැපයීම

දිනකට බැරල් 50,000 ක ධාරිතාවයකින් යුතුව සපුගස්කන්ද පිරිපහදුව 1969 වසරේ දී ඉදිකරන ලද අතර වර්තමානයේ එමඟින් දේශීය ඉන්ධන අවශ්‍යතාවයෙන් 25%ක් පමණ පිරිපහදු කර සැපයීම සිදු කරනු ලැබේ. ඒ අනුව දේශීය ඉන්ධන අවශ්‍යතාවය දේශීයව පිරිපහදු කිරීමේ අරමුණින් සපුගස්කන්දේ දිනකට බැරල් 100,000 ක පිරිපහදු ධාරිතාවයකින් යුතු නව පිරිපහදුවක් ඉදිකිරීම සහ පවත්නා පිරිපහදුව පුළුල් කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකරන ලදි. නව පිරිපහදුව ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර වසර 2026 වන විට නව ඉන්ධන පිරිපහදුවේ ඉදිරීම් අවසන් කිරීමට අපේක්ෂිතය.

(ඇ) ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම

ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති වීමෙන් ප්‍රශස්ත ආරක්ෂිත තොගයක් තබාගත නොහැකි වීමේ අවදානම වලක්වා ගැනීම සඳහා ඛනිජ තෙල් ගබඩා ධාරිතාවය පුළුල් කරමින් දේශීය දෛනික ඛනිජ තෙල් ඉල්ලුම ඕනෑම අවස්ථාවක දින 30 කට ප්‍රමාණවත් වන පරිදි ආරක්ෂිත තොග පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.

මෙම අරමුණ ඉටු කර ගැනීමට ඝණ මීටර් 93,000ක ධාරිතාවයෙන් යුතු ටැංකි 9 ක් ඉදිකිරීම සැලසුම් ගත කාල වකවානුව තුළ අවසන් කිරීමටත්, පවත්නා ඉන්ධන ටැංකි අලුත්වැඩියා කිරීමටත් සැලසුම් කර ඇත. තවද ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ සංවර්ධන කටයුතු කඩිනමින් අවසන් කර එම ටැංකි සංකීර්ණය නැවත ඉන්ධන ගබඩා කිරීමේ කටයුතු සඳහා යොදා ගැනීමට ඉඩ සලසනු ඇත.

(ඈ) ඉන්ධන ප්‍රවාහන නළ පද්ධතිය සංවර්ධනය කිරීම

නළ මඟින් ඉන්ධන ප්‍රවාහනය කාර්යක්ෂම මෙන්ම අඩු පිරිවැය මාධ්‍යක් වන අතර ශ්‍රී ලංකාවේ නළ මඟින් ඉන්ධන ප්‍රවාහනය තෙල් නැවක සිට ප්‍රධාන පර්යන්ත වෙත හා පිරිපහදුව වෙත ඉන්ධන ප්‍රවාහනයට සහ පිරිපහදුවේ සිට ගබඩා පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගනු ලබන අතර, සුළු වශයෙන් විදුලිය ජනනය කරන බලාගාර වෙත ඉන්ධන නළ මඟින් ප්‍රවාහනය සිදු කරනු ලබයි.

මෙ.ටො. 40,000 ක ධාරිතාවයෙන් යුතු නැවක ඉන්ධන ගොඩබෑමේ කාලය ඉදිරි වසර 03 තුළ

දී දින 04 ක් දක්වා ද, දිගුකාලීනව දින 02 ක් දක්වාද වන පරිදි අඩු කිරීම සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රවාහන නළ පද්ධතිය සංවර්ධනය කිරීම තුළින් ඉන්ධන ගොඩබෑමේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

තවද ගුවන් යානා ඉන්ධන ප්‍රවාහනය සඳහා මුතුරාජවෙල සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ දක්වා 22 Km ක් පමණ දිගින් යුතු නළ මාර්ගයක් සහ මුතුරාජවෙල පර්යන්තයේ ගුවන් යානා ඉන්ධන ගබඩා සංකීර්ණයක් ඉදි කිරීම මගින් වැඩිවන ගුවන්යානා ඉන්ධන ඉල්ලුම කාර්යක්ෂමව සැපයීම තහවුරු කිරීමට කටයුතු කරනු ලැබේ. යෝජිත කෙරවලපිටිය ප්‍රතිවායුකරණ ඒකකයේ සිට කැළණිතිස්ස විදුලි බලාගාරය දක්වා විදුලිය නිෂ්පාදනය සඳහා ස්වභාවික වායු ප්‍රවාහන නළ මාර්ග පද්ධතිය "ඉදිකිරීම, අයිතිකර ගැනීම, ක්‍රියාත්මක කිරීම, පැවරීම" (BOOT) යන ව්‍යාපාර මාදිළිය යටතේ වසර 2024 වන විට අවසන් කිරීමට කටයුතු කරනු ඇත.

(ඉ) දේශීය බලශක්ති මිශ්‍රණයට ජීව ඉන්ධන හා හරිත හයිඩ්‍රජන් හඳුන්වා දීම

රටෙහි සංවර්ධනයට අත්‍යාවශ්‍ය සාධකයක් වන ඉන්ධන, අවම අහිතකර පාරිසරික බලපෑම් සහිතව ලබා ගැනීමේ අරමුණ පෙරදැරිව ජීව ඉන්ධන (Bio Fuel) හා හරිත හයිඩ්‍රජන් (Green Hydrogen) යන බලශක්ති ප්‍රභේද ශ්‍රී ලංකාවේ. බලශක්ති මිශ්‍රණයට දායක කිරීමට අවධානය යොමුව ඇත. මේ සඳහා අදාළ තාක්ෂණික අධ්‍යයනයන් දැනටමත් ආරම්භ කර ඇත.

2.4 මුහුණ දුන් ප්‍රධාන අභියෝග

ප්‍රතිපත්තිමය මගපෙන්වීම හා උපාය මාර්ගික අරමුණු පෙරදැරිව බලශක්ති අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුළ පෙර භාග ඛනිජ තෙල් කර්මාන්තය සංවර්ධනයට සහ පසු භාග ඛනිජ තෙල් කර්මාන්තය සංවර්ධනයට විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කිරීම/ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී. කෙසේවෙතත් පසුගිය වර්ෂය දෙක තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ආර්ථික හා සමාජයීය බලපෑම හේතුවෙන් පනවන ලද සංචරණ සීමා ද ආනයන සීමා ද මධ්‍යයේ සංවර්ධන වැඩසටහන්හි අපේක්ෂිත ඉලක්ක ලගා කර ගැනීම සඳහා කටයුතු කරන ලද අතර එහිදී පහත අභියෝගයන්ට මුහුණ දෙන ලදි.

- ඛනිජ තෙල් ගවේෂණය පිණිස ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම සඳහා පැවති නීතිමය හා ආයතනික රාමුව ප්‍රමාණවත් නොවීම.

- බලශක්ති සුරක්ෂිතතාවය හා අඩු වියදම් බලශක්තිය තහවුරු කිරීම සඳහා පවතින යටිතල පහසුකම් පද්ධතිය ප්‍රමාණවත් නොවන අතර සැලසුම් කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති මූල්‍යනය කිරීමේ අභියෝග යට පසුගිය වසර තුළ දී මුහුණ දීමට සිදු විය.

- ඉන්ධන විකුණුම් මිල හා ආනයන බදු තීරණය කිරීම මහා භාණ්ඩාගාරයෙන් සිදුකිරීමත් බදු ඇතුළත් ඉන්ධන ආනයන පිරිවැය හා අනෙකුත් මූල්‍ය පිරිවැය ආවරණය කෙරෙන පරිදි, පිරිවැයට සමානුපාතික විකුණුම් මිලක් තීරණය කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නොහැකිවීමත්, හේතුවෙන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවීම.

- ඉන්ධන ආනයනය සඳහා අධික විදේශ විනිමය පිරිවැයක් දැරීමට සිදුවීම සහ රට තුළ විදේශ විනිමය ස්ථාවර භාවය පවත්වාගෙන යාමට සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඩොලර් ණය ලබා ගැනීමට සිදුවීම සහ ඒ මත වන පොලී හේතුවෙන් සංස්ථාවේ ඩොලර් ණය ඩොලර් බිලියන 3.7 ක් දක්වා ඉහළ යාම.

